www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Islam
## ඉස්ලාම්

Name :- ..................................................... Grade : -................ Index number:-....................

### I කොටස

1. නබි (සල්) තුමා යුදෙව්වන් සමඟ ඇති කර ගත් ගිවිසුමෙහි නම කුමක්ද?
   (i) හුදෙයිබියා ගිවිසුම (ii) බෛඅතුල් අකබා ගිවිසුම
   (iii) සහීෆතුල් මදීනා ගිවිසුම (iv) මක්කා කාර්ටා ගිවිසුම

2. අබ්දුර් රහ්මාන් බින් අවුෆ් (රළි) තුමාට තම දේපලෙන් බාගයක් දීමට හදවතින්ම ඉදිරිපත් වූ අන්සාරිවරයා කවුද?
   (i) සෛයිද් බින් අබී වක්කාෆ් (ii) සෑද් බින්ද් රබීඋ (රළි) තුමා
   (iii) උස්මාන් (රළි) තුමා (iv) අබුබක්කර් (රළි) තුමා

3. සුරා අල් කද්ර් අල් - කුර්ආනයේ කී වන පරිච්ඡේදයද?
   (i) 98 (ii) 99 (iii) 97 (iv) 89

4. ඉද්රීස් (අලෛ) තුමාට හිමි වූ සුහුෆ් ගණන කීයද?
   (i) 50 කි. (ii) 10කි. (iii) 12 කි. (iv) 30කි.

5. අයියාමුල් ෆීල් වලට අයත් දින වන්නේ,
   (i) සෑම මසකම 28, 29, 30 (ii) සෑම මසකම 11, 12, 13
   (iii) සෑම මසකම 13, 14, 15 (iv) සෑම මසකම 1, 2, 3

6. ඉස්ලාමීය වර්ෂය ගණනය කරනු ලබන්නේ කුමන සිදුවීමෙන් පසුවද?
   (i) නබි (සල්) තුමා මදීනාවේ පදිංචියෙන් පසු
   (ii) නබි (සල්) තුමාගේ මිඃරාජ ගමනින් පසු
   (iii) නබි (සල්) තුමාගේ නබිත්වයෙන් පසු
   (iv) අබුබක්කර් (රළි)තුමාගේ පාලන කාලයේ ඇති වූ අර්බුදයෙන් පසු

7. ආගම් හා සුහුෆ් යන දෙකම හිමි වූ නබිවරයා,
   (i) ඉද්රීස් (අලෛ) තුමා (ii) මූසා (අලෛ) තමා
   (iii) ඉබ්රාහීම් (අලෛ) තුමා (iv) නුහ් (අලෛ) තුමා



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

8. ඊමානයේ පහළම ශාඛාව කුමක්ද?
   (i) අන් අයට උදව් කිරීම
   (ii) සුන්නත් සවුමයේ යෙදීම
   (iii) මාර්ගයේ ඇති අනතුරුදායක දෑ ඉවත් කිරීම.
   (iv) අනාථයින්ට පිහිට වීම.

9. කියාමාවේ දී ප්‍රථමයෙන්ම විමර්ශනය කරනු ලබන්නේ කුමන අමලය ද?
   (i) සලාතය පිළිබඳ (ii) උපවාසය පිළිබඳ
   (iii) සකාතය පිළිබඳ (iv) බුද්ධිය පිළිබඳ

10. ''මුහාජිරීන්'' වරුන් යනු කවුරුන්ද?
   (i) අල් කුර්ආනය වනපොත් කළ අය (ii) අල් - කුරආනය කටපාඩම් කළ අය
   (iii) මක්කාවාසීන් (iv) මදීනාවාසීන්

➢ **නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.**

11. අරෆා දින උපවාසයේ යෙදීම ......................... වේ.

12. ඊසා (අලෛ) තුමාට පහළ වූ ආගම ............................ වේ.

13. ලේ කැටිය අරාබියෙන් ........................ ලෙස හැඳින්වේ.

14. ලෛලතුල් කාද්ර් රාත්‍රිය ..................... වඩා උතුම් වේ.

15. ඊමානයේ සියලු අංග වටහාගෙන විශ්වාස කිරීම .................... ලෙස හැඳින්වේ.

➢ **යා කරන්න.**

| | | |
|---|---|---|
| 16. පියාපත් වැඩිම සංඛ්‍යාවක් හිමි වූ මලායිකාවරයා | • | ඉහ්සාන්ය |
| 17. ජීවය අත්පත් කරගැනීමේ කාර්යයෙ නියුතු මලායිකාවරයා | • | එකත්වය |
| 18. අල්ලාහ්ට තිබිය නොහැකි ගුණාංග | • | ජිබ්රීල් (අලෛ) |
| 19. ''තව්හීද්'' ලෙස හැඳින්වෙන්නේ | • | ඉස්රායිල් (අලෛ) තුමා |
| 20. මිනිසා යන වචන අරාබියෙන් හැඳින්වෙන්නේ | • | ජායිස්ය. |

(20 × 2 = 40)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**
- **පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් ද අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ලකුණු 11 බැගින් ද හිමි වේ.**

1. (i) ඊමානයේ උසස්ම අංගය කුමක්ද?
   (ii) දික්ර් මගින් ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.
   (iii) සවුම්දාරින් හට පමණක් වෙන් වූ ස්වර්ගය කුමක්ද?
   (iv) අල්ලාහ්ගේ ගුණ නාම 2ක් ලියන්න.
   (v) තිලාවතුල් කුර්ආන් යනු කුමක්ද?
   (vi) සුළු කිල්ලෙන් මිදීමට කුමක් කළ යුතුද?
   (vii) ඊමාන් හි වර්ග 2 සඳහන් කරන්න.
   (viii) සාමාන්‍ය නජීස් වලට උදාහරණ 2ක් ලියන්න.

(2 × 8 = 16)

2. (i) ''වහී'' හි වර්ග දෙක සඳහන් කරන්න.
   (ii) තයමුම් සඳහා වන කොන්දෙසි 2ක් ලියන්න.
   (iii) a) අස් සවුම් අනිවාර්ය වූයේ හිජ්රි කී වන වසරේද?
   b) සව්මය අල්ලන්නේ නැතිව සිටීමට සහනයක් දී ඇති අය වර්ග තුනක් ලියන්න.

3. (i) දික්ර් හි වර්ග 2 ලියන්න.
   (ii) මස්ජිදුන් නබවියේ සේවාවන් 4ක් ලියන්න.
   (iii) සලාතය ජමාඅත් වශයෙන් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න.

4. (i) සතිපතා සුන්නත් වූ සවුමයේ යෙදිය හැකි දින 2 කුමක්ද?
   (ii) පව් සමාව අයැදීමේ දී පිළිපැදිය යුතු කොන්දේසි 2ක් ලියන්න.
   (iii) අල් කුර්ආනය පහළ කළ අන්දම කෙටියෙන් ලියන්න.

5. (i) ජබීරත් යනු කුමක්ද?
   (ii) සවුමයේ යෙදීම වළක්වා ඇති දින 3ක් ලියන්න.
   (iii) ජනාබත් තත්වයේ සිටින අයකු නොකළ යුතු ක්‍රියාවන් 3ක් ලියන්න.

6. (i) මිතුරන් සමග සිත් ගන්නා ලෙස ක්‍රියා කිරීමේ දී කළ යුතු යහපත් ක්‍රියාවන් 2ක් ලියන්න.
   (ii) සුන්නත් වූ ස්නානයේ යෙදිය හැකි දින 4ක් ලියන්න.



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(iii) පළමුවන, දෙවන හා තුන්වන යන කලිමා 3 නිවැරදිව සිංහලෙන් ලියන්න.

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk



agaram.lk